# මහජනතාව වෙත කරන දැනුම්දීමයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මුදල් ව්‍යාපාර පනත සහ කල්බදු මූල්‍යකරණ පනත යටතේ චිලව් ෆිනෑන්ස් පීඑල්සී ආයතනයට නිකුත් කර තිබූ බලපත්‍ර අවලංගු කිරීම

චිලව් ෆිනෑන්ස් පීඑල්සී හා රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම් ඒකාබද්ධ වීම හේතුකොට ගෙන 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ චිලව් ෆිනෑන්ස් පීඑල්සී සමාගමට මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා නිකුත් කර තිබූ බලපත්‍රයත්, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචියත් 2017.04.17 දින සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අවලංගු කල බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව මින් ඉදිරියට චිලව් ෆිනෑන්ස් පීඑල්සී ආයතනයට පොදු මහජනතාවගෙන් තැන්පතු ලබාගැනීමට හෝ මුදල් ව්‍යාපාර කටයුතුවල යෙදීමට නීතිමය බලයක් නොමැති බව දන්වා සිටිමු.

**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**8 වන මහල, ශ්‍රී ලංකා මහ බැංකුව , අංක 30, ජනාධිපති මාවත**
**කොළඹ 01**

**011-2477500 011-2477738/2477697 @ secdsnbfi@cbsl.lk**